
sinhalaebooks.com



# අනූමෙවෙනි ඛණ්ඩවාරය


මතකයක් හදවතේ පැළ කරමි
එය මා නමින් සුරකින්න ...

දිලංජන
මධුෂාන්
පතිරණ

sinhalaebooks.com

# අනුමෙවෙනි බණාවරය

මතකයක් හදවතේ පැළ කරමි
එය මා නමින් සුරකින්න



sinhalaebooks.com

**කතුවරයාගේ වෙනත් කෘති**

- සොඳුරු ගැමි ලිවිසැරියඃ මඩවල එස්. රත්නායක (2017)

**සංස්කරණ**

- සතර සවි දුන් තක්සලාවනිඃ ගිරි/හුම්බුළුව මධ්‍ය මහා විද්‍යාලයීය එකසිය විසි වර්ෂ පූර්ණ නිමිත්තෙන් සම්පාදිත ශාස්ත්‍රීය සංග්‍රහය (2018)
- සුනිල උත්පලඃ සුනිල් දයානන්ද කෝනාර සුභාවිත ගීත සම්ප්‍රදානය (2018)

sinhalaebooks.com

# අනුමෙවෙනි බණවරය

මතකයක් හදවතේ පැළ කරමි
එය මා නමින් සුරකින්න

**දිලංජන මධුෂාන් පතිරණ**
B.A. (Hons) (Reading) in Fine Arts, Peradeniya.

sinhalaebooks.com

Electronic Book 2021

අනුමෙවෙනි බණවරය (ලුහුඬු කාව්‍යාඛ්‍යානය)

**© දිලංජන මධුෂාන් පතිරණ**

ISBN 978-624-97699-0-8

**කවරයේ සිතුවම**

“Loneliness” Painting by Leyla Kucuk (2014)

**කවර නිර්මාණය, අක්ෂර සංයෝජනය සහ පිටු සැකැසුම**

දිලංජන මධුෂාන් පතිරණ

**කර්තෘ ප්‍රකාශන**

අංක 319, මීපිටිගෙදර, කැප්පිටිවලාන, අලව්ව.


Tone of Thoughts

https://dilanjanathoughts.blogspot.com/

sinhalaebooks.com

පුද'සුන

# ඈ ය'ට



සුසුමින් පවා සෙනෙහසකට'රුත් කියුව
අකුරක් වුණත් කඳුළකි පත්තිරු තෙමුව
වරමින් විනා නුඹෙ හද ගැඹුරින් ලැබුව
මගෙ මැ යි කියා දිනුමක් නැත මා සතු ව

sinhalaebooks.com



## පෙමතො ජායතී අසොකො

ප්‍රේමය යම් තැනෙක ඇත්තේ ද, එතැන ශෝකයක් නැත්තේ ය. ශෝකයක් වේ නම් එතැන ප්‍රේමයක් පැවතුණේ විය නො හැකි ය. මක් නිසා ද යත්, ශෝකය හටගන්නේ අහිමි වීම් සහ අපේක්ෂාවන් හේතු කොටගෙන බැවිනි. එබැවින් අප කිසි විටෙක හදවතට ප්‍රේමය අහිමි නො කළ යුතු ය. කිසිදු අපේක්ෂාවකින් තොර ව හදවත ප්‍රේමයෙන් පිරී පවත්නා තාක් කල් ජීවිතය සුන්දර ය; ප්‍රමුදිත ය; අශෝකී ය.

sinhalaebooks.com



හද වෙණ සැලී එකලා ව
ඉකි බිඳින තත්
වේදනාවෙන් ම සුසර කර
සුසුමකට දවටා
මතකයන් පා කර යවන විට
නො සිතන්න
ඒ
කවි බව

ගිම්හානයේ ගිලන් වී
විසුළ මල් දල
කටු තුඩුවලින් ම කුරුටු ගා
නෙතු කඳුළින් දොවා
ජීවත් වනුව මඟ බලන විට
නො සිතන්න
මා
කවියෙකු බව

sinhalaebooks.com



**පාසාණො නූන තෙ හදයෙ ඔහිතො මුදු ලක්ඛණෙ**
**යො තෙ සාතං න වින්දාමි තිරොජනපදාගතො**

(මෘදු වූ ලක්ෂණ ඇත්තිය, යම් බඳු වූ මම අන් රටකින් ආයෙම් තීගේ පිළිසඳර මාත්‍ර වූ සුවයක්වත් නො ලබන්නෙම් නම් මා කෙරෙහි ස්නේහය වැළැක්වීම පිණිස තීගේ හෘදයෙහි ගලක් තබන ලද්දේ ය කියා හඟිමි.) - කුස ජාතකය

sinhalaebooks.com



## එහෙයින්,
## මෙසේ ලියා තබනෙමි.



අප හමු වී සත් වසරක් ම ගෙවී යන්නේ වුව ද, අප වෙන් වී කෙතරම් කාලයක් ද යි මම නො දනිමි. තවමත් මසිතෙහි මැවී පෙනෙනුයේ ඇය මවෙත දිව ආ සැටි පමණි. එහෙත් ඇය සිප, වැලඳගන්නට බැරි වුණු කුමක් දෝ අවහිරයකින් මම පීඩිත ව සිටියෙමි. ඇගේ දෙනෙත් දිලිසුණි. මා ප්‍රථම වරට ලෝකය දුටුවේ, ඒ දෙනෙත් කාන්තියෙනි.

ඒ යථා ලෝකයට මම ආගන්තුක වීමි; එතෙක් මා විසුවේ කිනම් ලොවෙක්හි ද? එ-දිවියෙන් මා පැතූ අරුත කිම? නො දනිමි; මංමුළා වූයෙමි, මෙ-පැන විසඳාගත නුහුන ව ය. ඇය එ-සියල් නිසරු තැන් විමසමින් ද, ලොව යථාර්ථය පසිඳමින් ද, සෙත් කවියක් ව කරුණ රසයෙන් ගැයුණා ය. එහෙත් පෙදෙහි රසහව් විඳුනා - දෙනෙතා ඉතා දුලබ ම වී ය.

රමණීය වූ ප්‍රේමයේ මරණීය වේදනාවන්හි දී මිනිසුන් මිය යා නො දී ජීවත් කරවන්නෝ බලාපොරොත්තුහු ය. එය වඩා යහපත් දෙයක් යැ යි

sinhalaebooks.com



කිසිවෙකු කීව ද, මට එය පිළිගැනීමට සිත් නො දෙයි. සිහබා පවතෙහි දී සිහ රදු පාළු ලෙන තුළ ළය පැලී මියැදුණේ නම් කෙතරම් යහපත් නො වේ ද? සදාකාලික නො වන ජීවිතය කවදා කෙසේ හෝ නැසී යා යුතු ව ඇත. බලාපොරොත්තුන් විසින් සිදු කරනු ලබනුයේ ජීවත් කරවීමේ ව්‍යාජයෙන් වඩා වේදනාකාරී මරණයක් අත් කර දීම යැ යි හඟිමි.

වරක් මහැදුරු සමන්ත හේරතුන් සිය තුරුණු කවි ගෙත්තමක මෙසේ සඥහන් කර තිබුණි.

"මට අද
ජීවත් වීමට ඇති එක ම අයිතිය
ඔබ ම උදෙසා
ජීවිතය කැප කොට බලා සිටින්නට තරම්
ප්‍රබල වූ ද
පුණ්‍යවන්ත වූ ද
මගේ ආදරය පමණි." (1993)

ඉදින් මම ද තවමත් හුස්ම ගනිමින් සිටිමි.

දිවියට සපැමිණෙන කිසිවෙක් සදා කල්හි ම අප හා නො රැඳෙන නමුත් ඔවුහු සියල්ලෝ ම බොහෝ වටිනා දෑ අප දිවියට තිලිණ කරති; අප වෙනුවෙන් ඔවුන්ගේ මෙහෙය නිම කොට තුති පැසසුමකුදු නො පතා ම නිහඬ ව නික්ම යති.

sinhalaebooks.com



මෙ-කවි ද මට එසේ හිමි වූයේ වෙයි. කවියක වදන'රුතකුදු නො වැටහුණු මම කෙසේ කවි පබඳිම් ද? මට එවැන්නක් කිරීමට තරම් සමත්කමක් නැත. මහගම සේකර ද ලියූවේ මෙසේ, එබැවින් ම විය හැකි ය.

"මා ලියූ කවි රසැ යි කියමින්
නිබඳ ඔබ මට පසසනා මුත්
ඒ කවි හැම
මා හද මත
මුලින් ලියූවේ ඔබ ම යි."

මා කළේ ද ඇය මසිතෙහි ලියූ එ-කවි උපුටාගෙන මාගේ නමින් පළ කිරීමකි. ඇවැසි නම් බුද්ධිමය දේපළ හිමිකම යටතේ මවෙත නඩු පැවරිය හැකි ය. යම් හෙයකින් ඇය එසේ කළ හොත් ඊට වරදකරු වී හිස නමනු විනා එකුදු නිදහසට කරුණක් නො කියමි.

ඉතිකින් සබඳ, කවියෙකුගේ සිතෙහි බිහි ව රස ආත්මය කොට ගත් සොඳුරු වැකි නොවේ, මේ. දුක ආත්මය කොට ගත් වචන ගොන්නක් පමණි.

මේ වගට,

**දිලංජන මධුෂාන් පතිරණ**

2020 නොවැම්බර් මස 14වැනි දින දී ය.

sinhalaebooks.com





යසෝදරාවක සොයා නො යමි මම
සිදුහත් බෝසත් නො වන නිසා
පබවත රෑසිරැ සොයා නො යමි මම
සක්විති නිරිදෙකු නො වන නිසා

sinhalaebooks.com



# I

ජීවිතය දන් දී සදහට ම
අනුමෝදනා කරමි පින් පෙත්
නුඹේ හද චිතකයෙහි
දිවංගත ස්නේහයට

නෙත් පැන් වඩා නිම කළ
අතීතය පිරී ඉතිරී ගොසිනි
කාලයාගේ ඇවෑමෙන්... ...



"අනිච්චාවත සංඛාරා
උප්පාද වය ධම්මිනො"

අතගස්වනු පෙර ම පිරිකරය
නිමා විය මතක බණ පද
සුදු පාවාඩයට එපිටින් ම
සමිඳු වැඩියා යළිත් පන්සලට



sinhalaebooks.com





## II

දිවි බිමේ ඇදෙන විට සංසාර සෙවනැල්ල
සිත් කොනේ තව නුඹ ය උපදිනා සිතිවිල්ල
අසාගෙන මුනිවතින් හිතේ දුක්ගැනවිල්ල
කට්ට කළුවර ඇවිත් කිම ද මේ දැවටිල්ල

මල් සුවඳ හොරා ගන්නට නොදී රැකගන්න
ඉටි පහන් සිළ මාරුතය එක්ක පොර බදන
මතක පිරිමැද කමටහන් භාවනා වඩන
ජීවිතය සොහොන් කොත පාමුලට වී නිඳන

sinhalaebooks.com





## III

සුමුදු අතැඟිලි
තුඩින් පිරිමැද
පාඩම් පොතේ පිටු
පෙරලන්නී ඇය

සමාධි ව අසුන මත
මේසයට බර වී
බවුන් වඩනා
දඟකාර මුවැත්තිය

නිමා නො කර ම
පාඩම
වසා පොත

sinhalaebooks.com



සීරුවට පුටුව ඇද්දා ය
පසු පසට

නැඟී හුන් අසුනින්
කැරකී පිටු පසට
සුදු රැලි ගවුම සසලා
තුරුලු කරගත්තා ය
පොත් මිටිය

නෙත් හෙළූ විට
රහසේ ම
හිස නවාගෙන
මුව'ග රැඳි මඳහසට
දිලිසුණි නෙත් යටින්
පුංචි ම කඳුළු කැටයක්

මුමුණ මුමුණා
කෝමල පිය තෙපුල්
මිතුරියන් පිරිවරා
දිව යන විටදී ඈතට

දරාගනු බැරි
හැඟුම් තනි කර
හඬ නැඟුණි
පාසල ඇරෙන සීනුව

sinhalaebooks.com



## IV



දොර වැසුණු පන්ති කාමරය ඈතට පෙනෙන
කළු ලෑල්ලේ අකුරු කොට බිත්තියෙන් එබෙන
අරුත් පටලැවෙන ලෙස මැකී ගිය තැනින් තැන
එදා නොම පසක් වුණු දහසකුත් දෑ කියන

sinhalaebooks.com



සෙවන දුන් ගහවැල ද
මල් බරින් නිදහස් ව
අපේ සිත් වාගේ ම
කඳුළු මල් බිම හෙළන

*"එපා ඒ මල් පයට පෑගෙන්න ඉඩ දෙන්න*
*වසන්තය අපට හිමි නෑ ඉතින් සකි සඳුණ"*

පාසලේ ගේට්ටුව අද්දරට වී ඉන්න
එක ම එක වතාවක් යළිත් නුඹ දැකගන්න
නා මලින් සුවඳ දෙන සුදු පාට වැලි මිදුල
මගේ දෙපයට අදින් මතු ව සියුමැලි වැඩි ය

අතින් අතවත් අල්ල -
ගන්න බිය වුණු එදින
කඩදාසියක වැතිර
හදවත ම ඉකි බිඳිණ

*"ආදරේ අකුරු අත නුහුරුවට ගැට ගැසුණ*
*අමතක ව නෑ එදා නුඹෙන් ලද පෙම් හසුන"*

වියපත් ය මල් සමය නිති සිනා කෙළි පිරුණ
ගයා නිම නො වුණු කවි තාල තවමත් ඇසෙන
පාසලේ ගේට්ටුව අද්දරට වී ඉන්න
එක ම එක වතාවක් යළිත් නුඹ දැකගන්න

sinhalaebooks.com




ඈත හිස් අහස මත මේ වලා පෙළ සැදෙන
වේදනා පිනි බින්දු වී බිමට ඇද හැලෙන
හාත්පස බොඳ වෙලා හෙමිහෙමින් ඇඳිරි වෙන
මගේ සිත මා ළඟ ම ගොළු වෙලා ඉකි බිඳින

*             *             *

දකුණු පැත්තෙන් අයින් වී යන්න
කලබලයි මහ පාර හරියට
රෝස පැහැ මල් කුඩය අරගන්න
එපා මේ වැස්සට තෙමෙන්නට

හෙටත් උදයෙන් ඉස්කෝලෙ එන්න
අසනීප වෙයි තෙමුණොත් නුඹට
අනේ අදවත් නො තෙමෙන්න
එදා එක කුඩය මදි වුණත් වැස්සට

හෙටත් හිරු පායාවි ඉස්කෝලයට
මා නැතත් කිසි ම වෙනසක් නැති ව
මල් පිපී සුළඟේ ලෙළෙන විට
ඉතින් නුඹටත් හිතෙයි එළි වෙන්න



sinhalaebooks.com



# V

ඔබ විවර කළ හද දොර
අගුළු ලා ගියේ කිම
මතක පමණක් සිර කර
කිසිවෙකුට කිසි ම දා
යළිත් පැමිණිය නො හැකි ලෙස

මේ අවසාන හසුන යි
පිළිතුරක් ලියා නො එවන්න

එවිට මට
මියෙන තුරු ජීවත් වන්නට
එක ම එක බලාපොරොත්තුවක්වත්
සදහට ඉතිරි වේවි

*		*		*

ඉතින් ඔබ සමුගන්න
වෙලාව යි ළබැඳියෙනි
ජීවිතය කියා දුන්
පාඩමක නිමාව යි

මවෙත පවරා අතීතේ බර
සිනා අත්තටු සලා ඉගිලෙන්න
මා නො දත් නුඹ සොයන කෙම් බිම

sinhalaebooks.com



හමු වේවි නුදුරේ ම, දිනයෙක

විරහ ගිම්හානයට
විහඟ ගීයක් වුව මැනව එදවසට
වසන්තය ගැන කියන
මල් සුවඳ නොම දනෙයි
මේ දෙසට...

මේ අඳුරු ක්ෂිතිජය තමයි
අහස පොළොවට පෙම් බඳින
මායාවක් සේ පෙනෙන
එහෙත්,
මීට වැඩියෙන් යමක්
වැටහේවි නුඹට දිනයෙක

හැරී එන්නට සිතුණොත්
යන අතර මඟ දී
ඉස්සර වාගේ ම
එක ම එක කඳුළු කැටයක්
සුසුමකින් පා කර එවන්න

මතක නැති නම්
එන පාර ආපසු
පෙර මඟට එන්නම් මම
නුඹට මඟ කියන්නට



sinhalaebooks.com



# VI

ඇවැත් වුණු සුපෙම් වත
අබිමුව වැටුණු කඳුළක
පණ ගැහුණු හුස්ම පොද
සතු වුණේ ලොව එක ම හදකට

දිවියේ මිහිර පැහැදූ
අනුමෙවෙනි බණවර නිමා වෙත
එ-හද මුනිවත අස
අත්හැරිණි ආයු සංස්කාරය



ගෙවා ගිය මතක මඟ ඉම
සදාතන දිය දහම් පුදනුව
පර ව ගිය නැති රෝස කුසුමක්
නටු අගින් බිමට වැඩියෙ ය

sinhalaebooks.com



**මල්සර බැලුම’සෙක්නි - (නො) වෙත්වා පෙම් දනො**
**පෙමෙහි රස හව් විඳුනා - මනසා ඉතා දුලබෝ**

**(නො)නිමි.**

සංසාරය දුර ය.

sinhalaebooks.com

ගනඳුරට අත වනන සැඳෑ අස
පර ව යන බව දැන දැන ම
හෙටත් හිරු නැඟෙන තුරු
මිලින මල් ළතැවේවි පිබිදෙන්න

දිලංජන
මධුෂාන්
පතිරණ

ISBN 978-624-97699-0-8
9 786249 769908